sinhalaebooks.com

# ධනවතුන් බිහිකරන කොටස් වෙළඳපොළ ආයෝජනය සරලව

## ආධුනිකයන්ට සහ සිසුන්ට



Author R.Dissanayaka
Website www.xbrandzme.com

E Book

sinhalaebooks.com



# ධනවතුන් බිහිකරන කොටස් වෙළඳපොළ ආයෝජනය සරලව


රටක ආර්ථිකය මනින ප්‍රදාන මිනුම් ඒකකයක් සහා සාර්ථක මිනිසුන් බිහි කරන කොටස් වෙළඳපොළ සදහා නවක ආයෝජකයින් ගෙන්වා ගැනීම සහ කොටස් වෙළඳපොළ ආයෝජනය පිළිබද ඉතාම සරලව ජනතාව දැනුවත් කිරීම මෙම "ධනවතුන් බිහි කරන කොටස් වෙළඳපොළ ආයෝජන" ග්‍රන්ථයේ ( E Book ) ප්‍රධාන අරමුණයි.

කොටස් වෙළඳපොළට පිවිසීමේ සිට දැනගත යුතු සියළු කරුනු ඉතාම සරලව සහ කෙටියෙන් මේ පොත තුල අඩංගුව ඇත.



sinhalaebooks.com






Rule no .1 NEVER LOSE MONEY

Rule no .2 NEVER FROGET RULE NO .1

**WARREN BUFFET**

පළමු නිතිය - කිසි දිනක ඔබ ආයොජනය කල මුදල නැතිකරගන්න එපා

දෙවැනි නීතිය - කිසි දිනක පළමු නිතිය අමතක කරන්න එපා

sinhalaebooks.com



මුලින්ම සියලුම දෙනාට ස්තුතිවන්ත වෙනවා මෙම E BOOK එක මිලදී ගැනීම සම්බන්ධව. මෙහි මුලික අරමුණ කොටස් වෙළදපොළ කියන්නේ කුමක්ද? මෙහි ආයෝජනය කර මුදල් උපයන්නේ කෙසෙද යන්න සරලව සිංහලෙන් පැහැදිලි කර දීමයි.

බොහෝ දෙනා ආයෝජනට කැමති වුණත්. කොටස් වෙළදපොළ සම්බන්ධව උගන්වන බොහෝ දෙනා ඉතා සංකිර්ණ සිංහල වචන භාවිතා කරන අතර, ( කොටස් වෙළෙඳපොළ තුළ භාවිතා කරන වචන )

එම වචන තෙරුම් ගැනිමට නොහැකි විම නිසා, බොහොමයක් නවක ආයෝජකයින්

මෙම කොටස් වෙළදපොළ පිළිබඳ වැරදි ආකල්ප දැරිම සහා කොටස් වෙළදපොළට පැමිණෙන මුලික අදියර පිළිබඳ කිසි කෙනෙකුගේ විශේෂ අවධානයක් යොමු වන්නෙ නැ.

sinhalaebooks.com



ඉතින් මෙම E BOOK එක හරහා අප ඔබට ඉතා සරලව මෙම කොටස් වෙළෙඳපොළ පිලිබඳ කියා දිමට උත්සහා කරනවා.

මෙම පොත සඳහා ඉතා සුලු මුදලක් අප යෝජනා කර තියෙනවා

එම මුදලට වඩා වටිනා දැනුම් සම්භාරයක් ඔබ වෙත ගෙන ඒමට අප සූදානම්..

" කිසිදිනක මෙම මුදල අපතේ යැමක් සිදු වන්නේ නෑ. මේ මුදල ඔබගේ දැනුම වෙනුවෙන් ආයෝජනය කළ මුදලක්.."

දැන් සරලව තේරුම් ගන්න ආයෝජනයක ඇති වටිනාකම

sinhalaebooks.com



හිතන්න ඔබ මෙම පොත මිලදී ගැනීම සඳහා යම් මුදල් ආයෝජනයක් කරනවා. ඒ වෙනුවෙන් ඔබට මහා දැනුම් සම්භාරයක් ලැබෙනවා. මෙයින් පැහැදිලි වන්නේ  එය සාර්ථක ආයෝජනයක් බවයි.

අපි තව බලමු ඔබ යම් මුදල් ආයෝජනයක් කරනවා එහිදී ඔබට අලාභයක් සිදුවෙනවා. ඒ කියන්නේ එය සාර්ථක  මුදල් ආයෝජනයක් නොවෙයි.

නමුත් ඔබ සෘණාත්මකව සිටීමට අවශ්‍යතාවයක් නෑ

මෙහිදී ඔබ නොදැනුවත්වම ලොකු දැනුමක් ලබාගෙන තියෙනවා..

sinhalaebooks.com



## බලමු අපි ඒ මොනවද කියලා

ඔබ මෙම ආයෝජනයේදී සිදු වූ වැරදි අඩුපාඩු පිලිබද මේ වනවිටත් දැනුවත්. ඉතින් ඔබ මිළඟ මුදල් ආයෝජනය දී එම වැරදි නැවත සිදුවීම වළක්වා ගැනීමට අවශ්‍ය දැනුම මෙ වන විටත් ඔබ සතුව ඇත.  එම නිසා ඔබ සැම විටම ධනාත්මකව සිටින්න.

වැරදි අඩුපාඩු හදා ගනිමින් අධ්‍යයනය කරමින් අපි මෙම ගමන යමු..

**ඉතින් කොටස් වෙළෙඳපොළ ගැන කතා කරද්දි මේ දේ ඉතාම වැදගත්**

**" පීනන හැටි ඉගෙනගන්න ඕනනම් වතුරට බහින්නම වෙනවා "**

sinhalaebooks.com



අන්න ඒ වගේ කොටස් වෙළෙඳපොළ ගැන ඔබට ඉගෙනීමට අවශ්‍ය නම් කොටස් වෙළෙඳපොළට පිවිසීම අත්‍යවශ්‍ය කරුණක්.

අධ්‍යනය කරමින් අත්දැකීම් ලබා ගනිමින් තොරතුරු රැස්කරමින් මෙම ගමන යාම ඉතාම වැදගත්.

sinhalaebooks.com



# පටුන

1) කොටස් වෙළඳපොළ කියන්නේ කුමක්ද?

2) කොටස් යනු මොනවාද ?

3) කොටස් මිලදී ගැනීමේදී අපට ඇති වාසි සහ සමාගම්වලට ඇති වාසි

4) කොටස් තැරැව්කාර සමාගම්

5) මධ්‍යම තැන්පතු ක්‍රමය C.D.S

6) කොටස් වෙළඳපොළ පිවිසුම

7) කොටස් වෙළඳපොළ ආයෝජන ක්‍රම

8) කොටස් මිලදී ගැනීමේ ක්‍රම

9) කොටස් මිල දර්ශක

10) කොටස් මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

11) තැරව්කාර  සමාගම් පිළිබඳ තොරතුරු

X Brand

දනවතුන් බිහිකරන කොටස් වෙළඳපොළ ආයෝජනය සරලව

sinhalaebooks.com



# 1.

# කොටස් වෙළඳපළ කියන්නෙ කුමක්ද?




ඉතා විශාල සහ ප්‍රසිද්ධ සමාගම් වල තම ව්‍යාපාර අයිතියෙන් යම් ප්‍රමාණයක් ඉතා කුඩා කොටස් ලෙස කඩා මහජනතාවට මිලදී ගැනීමට නිකුත් කිරීමක් කරයි. එම කොටස් නිකුත්

sinhalaebooks.com



කරන්නේ කොළඹ කොටස් වෙළඳපොළ හරහායි.

කොළඹ කොටස් වෙළඳපොළ යනු මෙම කොටස් මිලදී ගැනීම සහ විකිණීමෙ විශාල වෙළෙඳ පොළකි. මුදල් ආයෝජනය සඳහා විකල්ප මාර්ග සොයන බොහෝ පිරිසකගේ අවධානය මෙම කොටස් වෙළෙඳපොළ සඳහා යොමු වේ.

මෙහි විකුණුම් සහ ගැනීම් අපට අන්තර්ජාලය හරහා ද සිදුකල හැකිය.

මෙම කොටස් වෙළෙඳපොළ ගැන ඇල්මක් දක්වන අයට කොටස් වෙළඳ පොළ හරහා ප්‍රසිද්ධ විශාල සමාගම් වල කොටස් මිලට ගැනීමට හැකිය.

sinhalaebooks.com



කොළඹ කොටස් වෙළඳපොළ ලිපිනය : -

කොළඹ කොටස් හුවමාරුව,

**04 01**, බටහිර කොටස,

ලෝක වෙළඳ මධ්‍යස්ථානය,

එච්ලන් චතුරශ්‍රය,

කොළඹ 01

දුරකථන අංක :-

**011- 2356456 / 011- 2446581**

ෆැක්ස් :- 011-**2445279**

විද්‍යුත් ලිපිනය :- INFO@CSE.LK

නිල වෙබ් අඩවිය :- **WWW.CSE.LK**

sinhalaebooks.com



# 2.

## කොටස් යනු මොනවාද?

සිතන්න X කියලා සමාගමක් තියෙනවා ( X = සමාගමේ නම ) ඉතින් මේ සමාගමට උවමනා වෙනවා තමන්ගේ සමාගමේ නව සංවර්ධන කටයුතු සඳහා මුදල් සොයා ගන්න. ඔවුන්ට පුළුවන් බැංකුවකට ගිහින් ණයක් ගන්න. ( එහිදී ඔවුන්ගේ ණය මුදලට පොලියක් එකතු වෙනවා )

තව පුළුවන් තම සමාගමේ අයිතියෙන් යම් ප්‍රතිශතයක් කුඩා කොටස් ලෙස කඩා මහජනතාවට මිලදී ගත හැකි ලෙස කොටස් වෙළඳපොළට නිකුත් කිරීමට මෙහිදී පොලියක් නොමැතිව ප්‍රාග්ධනය ( ප්‍රාග්ධනය = මුදල් ) ලබා ගැනීමේ හැකියාව තියෙනවා.

sinhalaebooks.com



**" සමාගමේ මුළු වටිනාකම යනු = කොටස් වෙළඳපොලේ ඇති කොටස් ප්‍රමාණය × කොටස් වෙළඳපොලේ ගනුදෙනු වන මිල "**

උදා :- **X** සමාගම කොටස් වෙළඳපොළට නිකුත්කර ඇති කොටස් ප්‍රමාණය 100 යි. එම කොටසක් කොටස් වෙළඳපොලේ ගනුදෙනු වන මිල රු 10.00යි. එවිට සමාගමේ මුළු වටිනාකම රු 1000.00 යි.

**( 100 × 10 = 1000 )**

සමාගමක අයිතිකරුවා යොදා ඇති මුදල කොටස් ප්‍රාග්ධනය ලෙස හඳුන්වනවා.

sinhalaebooks.com



මෙම ප්‍රාග්ධනය සමාන කොටස් වලට බෙදූ පසු ඔබ එම කොටස් මිලදී ගැනීමේදී ඔබ සතු කොටස් ප්‍රමාණයෙන් ඔබට ඇති  සමාගමේ අයිතිය පෙන්නුම් කරනවා.

**ඒක අපි සරලව බලමු**

X සමාගම කොටස් වෙළඳපොළට කොටස් 100ක් නිකුත් කරනවා

එක කොටසක වටිනාකම රු 1.00 යි. ඔබ එම සමාගමේ කොටස් 5 ක් මිලදී ගන්නවා රු 5.00කට එතකොට ඔබට එම සමාගමේ (  5% ) සියයට පහක අයිතියක් තියෙනවා.

අපි මේක තව ලොකු ගානක් දාලා බලමු

sinhalaebooks.com



X සමාගම කොටස් 100000 ක් කොටස් වෙළඳපොළට නිකුත් කරනවා ඔබ එම සමාගමේ කොටස් 5000ක් මිලදී ගන්නවා ඒ කියන්නෙ ඔබ එම සමාගමේ 5% ක හිමිකාරත්වයක් තියනවා.

**සියයට ප්‍රතිශතයක් ලෙස බලන සමීකරණය**

$$\frac{\text{ඔබ සතු කොටස් ප්‍රමාණය}}{\text{සමාගම සතු කොටස් ප්‍රමාණය}} \times 100$$

$$\frac{5000}{100000} \times 100$$

sinhalaebooks.com



# 3.

## කොටස් මිලදී ගැනීමේදී අපට ඇති වාසි සහ සමාගම් වලට ඇති වාසි

### සමාගමට ඇති වාසි

- සමාගමට අවශ්‍ය ප්‍රාග්ධනය ඉක්මනින් සොයා ගැනීමට හැකි විම.
- සමාගමේ කීර්තිනාමය වැඩිවීම.
- සමාගමේ මුළු වටිනාකම ඉහළ යාම.
- පොලියක් රහිතව ප්‍රාග්ධනය රැස් කිරීමට හැකිවීම.
- විවිධ බදු සහන ලැබීම.
- ආයෝජකයන් විශාල ප්‍රමාණයක් සමාගමට සම්බන්ධ කර ගැනීමට හැකියාව ලැබීම.

වගේ සෑහෙන වාසි ප්‍රමාණයක් සමාගම සතු වනවා

sinhalaebooks.com



## කොටස් හිමියන්ට ඇති වාසි ( අපට ඇති වාසි )

- ලාභාංශ
- සංචිත ප්‍රාග් ධනය
- හිමිකම් නිකුතු
- විභේදන
- පාර්ශවීය අයිතිය වැනි තව බොහෝ දෑ

ඉතිං අපිට වැදගත් කාරණය වන්නේ කොටස් හිමියකු ට ඇති වාසි සම්බන්ධවයි අපි ඒ ගැන ටිකක් ගැඹුරින් කතා කරමු.

sinhalaebooks.com



## ලාභාංශ

සමාගමක් තමා උපයාගත් ලාභයෙන් කොටස් හිමියන්ට අයිති ලාභය කොටස් හිමියන්ගේ අයිතිය අනුව බෙදා දීම ලාභාංශය වේ.

මෙය කාර්තු අනුව හෝ වාර්ෂික වශයෙන් සිදුවිය හැකිය.

සාමාන්‍යයෙන් සමාගමක් මෙසේ ලාභාංශ ගෙව්වත් සමාගම් විසින් ලාභාංශ ගෙවීම අනිවාර්ය කරුණක් නොවේ.

**" අපි කොටස් මිලදී ගැනීමේදී කරන විශ්ලේෂණයේදී මේ පිළිබඳව අවධානය යොමු කළ යුතුය "**

**විශ්ලේෂණය =** සමාගම පිළිබඳ අප සොයන තොරතුරු

sinhalaebooks.com



**උදා :-** හිතන්න ඔබ X සමාගමේ නිකුත් කරපු කොටස් 100න්

5ක් මිලදී ගන්නවා එවිට ඔබට මෙම සමාගමේ 5% ක අයිතියක් තිබෙනවා ඒ කියන්නේ සමාගම උපයාගත් ලාභයෙන් ඔබගේ කොටස් වලට අදාල ලාභය **( 5% )** ඔබට ලබා දීම ලාභාංශය වේ.

මෙහිදී ලාභාංශ ලබා දීමේදී සමාගම විසින් ලාභාංශ ලබා දෙන නිශ්චිත දිනය වන විට අප එම කොටස්වල හිමිකරු ලෙස සිටිය යුතුය. ඔබ එම සමාගමේ කොටස් විකුණා තිබුනොත් මෙම ලාභාංශ ඔබට හිමි වන්නේ නෑ

sinhalaebooks.com



## සංචිත ප්‍රාග්ධනීකරණය

සංචිත යනු සමාගම් වල ලාභය කොටස් හිමියන්ට ලාභාංශ වශයෙන් නොදී සංචිත ලෙස පවත්වා ගැනීමයි.

මෙහිදී කොටස් හිමියන්ට නොමිලේ කොටස් ලබා දෙනවා

**" නිශ්චිත කොටස් ප්‍රමාණයක් යම් අනුපාතයකට කොටස් හිමියන්ට නොමිලේ හිමිවනවා "**

මේ මගින් කොටස්වල ද්‍රවශීලතාවය වැඩිවන අතර කොටස් හිමියාට අමතර ප්‍රතිලාභ ලැබෙනවා

**ද්‍රවශීලතාවය = ඉක්මනින් මුදල් කිරීම**

( විකිණීමෙ ) හැකියාව

sinhalaebooks.com



## **හිමිකම් නිකුතුව**

සමාගමේ සිටින කොටස් හිමියන්ට යම් අනුපාතයකට ඔවුන් සතු කොටස් ප්‍රමාණය අනුව අලුත් කොටස් ප්‍රමාණයක් ලබා දීම මෙහිදී සිදු වේ.

මෙහිදී බොහෝ විට සමාගම විසින් වෙළෙඳපොළ මිලට වඩා අඩුවෙන් කොටස් හිමියන්ට මෙම කොටස් ලබා දෙයි. එහිදී අඩු මිලකට කොටස් මිලදී ගේන අනිත් අතට වැඩි මිලකට කොටස් විකිණීමට වර්තමාන කොටස් හිමියන්ට හැකියාව ලැබේ.

sinhalaebooks.com



## විභාජනය

මෙහිදී සමාගම විසින් නිකුත් කර ඇති කොටස් යම් අනුපාතයකට බෙදා හරිනු ලබයි. මෙහිදී සමාගමේ කොටස් ප්‍රමාණය ඉහළ යන අතර ප්‍රකාශිත ප්‍රාග්ධනයෙ ඉහළ යාමක් සිදුවන්නේ නැත.

සරලව කිව්වොත් මෙහිදී කොටස් හිමියන් තුළ ඇති කොටස් ප්‍රමාණය ඉහළ යයි.

## වෙනත් වාසි

- කොටස් හිමියන්ට ලැබෙනවා ඉහළ ද්‍රවශීල තාවයක්.

ද්‍රවශීල තාවය :- හිතන්න ඔබ ආයෝජනයක් වශයෙන් ඉඩමක් මිලදී ගන්නවා කියලා. ඔබට

sinhalaebooks.com



නැවත මුදල් උවමනා වූ විට. එම ඉඩම විකිණීමේදි ලොකු පරීක්ෂමයක් දැරීමට සිදුවෙනවා.

නමුත් ඔබ කොටස් වෙළෙඳපොළ මගින් මිලදි ගත් කොටස් ඉක්මනින් විකුණා ගැනීමේ හැකියාව ලැබෙනවා.

- උද්ධමනයේ අහිතකර බලපෑම් අවම කිරීමට හැකිවීම
- වැදගත්ම කාරණය කොටස් විකිණීමේදී ලැබෙන ප්‍රාග්ධන ලාබය ලංකාව තුළ ආදායම් බද්දෙන් 100 % ම නිදහස් විම
- දිගු කාලීන ආයෝජනයක් මගින් ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවීම

- සමාගම විසින් දෙන වෙනත් ප්‍රතිලාභ

sinhalaebooks.com



# 4.

# කොටස් තැරැව්කාර සමාගම්



කොටස් වෙළඳපොළ කොටස් අපිට කෙලිම මිලදී ගන්න බෑ. ඒ සඳහා අපට අතරමැදියෙක් අවශ්‍ය වනවා. අන්න ඒ අතරමැදියට අපි කියන්නෙ කොටස් තැරැව්කාර සමාගම් කියලා අපි කොටස් මිලදී ගැනීම සහ

sinhalaebooks.com



**විකිණීම සිදු කරන්නේ මෙම කොටස් තැරැව්කාර සමාගම් හරහයි. ලංකාව තුළ කොටස් තැරැව්කාර ආයතන විශාල ප්‍රමාණයක් තියෙනවා**

බයවෙන්න එපා අපි දන්න brokersලා නෙමේ මෙයාලා.

**කොටස් තැරැව්කාර ආයතන යනු කොටස් වෙළෙඳපොළ තුළ කොටස් ගනුදෙනු සඳහා බලයලත් ආයතන වේ.**

මෙම ආයතන හරහා අපට බොහෝ සේවාවන් රැසක් සිදු කර දෙයි.

අප වෙනුවෙන් කොටස් මිලදී ගැනීම සහා විකිණීම, කොටස් වෙළඳපළ ආයෝජනය ගැන උපදෙස් ලබා දීම, C.D.S ගිණුම් විවෘත කර දීම,

sinhalaebooks.com



ගණුදෙනු බේරුම් කිරීම, කොටස් වෙළඳපළ සම්බන්ධ තොරතුරු සැපයීම මේ එයින් කීපයකි.

අපි කොටස් මිලදී ගැනීම සහ විකිණීමේදී තරැව්කාර සමාගම් ගාස්තු වශයෙන් යම් මුදලක් අයකරේ

## මිලියන 100 දක්වා

- තරැව්කාර ගාස්තු
  **0.640 %**
- කොටස් වෙළෙඳපොළ ගාස්තු
  **0.084 %**
- මධ්‍යම තැන්පතු ගාස්තු
  **0.024 %**
- සුරකුම් සහා විනිමය කොමිසම් ගාස්තුව
  **0.072 %**
- කොටස් ගනුදෙනු අයබදු
  **0.300 %**

sinhalaebooks.com



## මිලියන 100ට වඩා

- අවම තැරැව්කාර ගාස්තුව **0.200 %**
- කොටස් වෙළෙඳපොළ ගාස්තුව **0.0525 %**
- මධ්‍යම තැන්පතු ක්‍රමය ගාස්තුව **0.0150 %**
- සුරකුම් හා විනිමය කොමිෂන් ගාස්තුව **0.0450 %**
- කොටස් ගනුදෙනු අය බදු **0.300 %**

## කොටස් ආයෝජන උපදේශක

තැරැව්කාර ආයතන ගැන කතා කරද්දී අමතක කරන්නම බැරිම පුද්ගලයෙක් තමයි ආයෝජන උපදේශක කියන්නෙ. අපිට තැරැව්කාර ආයතනයකින් C D S ගිණුමක් සාදා නිමකළ

sinhalaebooks.com



පසු තරුවිකාර ආයතන මගින් සුදුසුකම් ලත් ආයෝජන උපදේශකයෙක් අප වෙනුවෙන් වෙන් කරනු ලබයි. අපගේ ඉදිරි කොටස් වෙළෙඳපොළ ගනුදෙනු සඳහා මැදිහත්ව කටයුතු කරන්නේ මෙම ආයෝජන උපදේශක විසිනි. අප වෙනුවෙන් කොටස් මිලදී ගැනීම විකිණීම ආයෝජන සඳහා උපදෙස් ලබා දීම වැනි වටිනා සේවාවන් රැසක් අපිට මෙම ආයෝජන උපදේශක විසින් ලබාගත හැක.

**" මෙම ආයෝජන උපදේශකයින් ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වාචික හා ලිඛිත පරීක්ෂණයකින් සමත් වූ පළපුරුදු උපදේශකවරුන් වේ "**

sinhalaebooks.com



# 5.

## මධ්‍යම තැන්පතු ක්‍රමය ( C.D.S ගිණුම )



ඔබට මෙම C.D.S ගිණුම 100%ක්ම නොමිලේ ඔබ තෝරාගත් තරුව්කාර ආයතනය මගින් ආරම්භ කිරීමට හැකියාව ඇත. එකම සුදුසුකම අවුරුදු 18ක් සම්පූර්ණ වීම පමණයි.

sinhalaebooks.com



එ සඳහා ඔබට අවශ්‍ය වනවා

- **විද්‍යුත් තැපැල් ලිපිනයක් ( EMAIL )**
- **ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්**
- **ස්ථිර පදිංචිය සහතික කිරීමට ( විදුලි බිල් පතක් හෝ ජල බිල්පතක් )**
- **බැංකු ගිණුමක් ( අංකය / ශාඛාව )**

තරුව්කාර ආයතනයෙන් ලබා දෙන අයදුම්පත සමග මෙම තොරතුරු තරුව්කාර ආයතනයට

බාරදීම මගින් පහසුවෙන් C.D.S ගිණුමක් විවෘත කළ හැක.

sinhalaebooks.com



# 6.

## කොටස් වෙළෙඳපොළ පිවිසුම



හරි අපි දැන් දන්නවා කොටස් වෙළඳපළ කියන්නෙ මොන වගේ වෙළඳ පොළක් ද එහිදී සිදුවන්නේ කුමක්ද කියලා ඉතින් මේ ටික තමා වැදගත්ම කොටස

sinhalaebooks.com



ගොඩක් අය අදි මදි කරන්නේ මෙන්න මෙම කොටසෙදි. අප මෙම කොටස ඉතාම සරලව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වනවා

කොටස් වෙළෙඳපොළට පිවිසීමේ මූලික අදියර වන්නේ තරුව්කාර ආයතනයක් තෝරා ගැනීමයි. තරුව්කාර ආයතනයක් තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු කීපයක් මෙසේ දක්වන්නම්

- ඔබ ආයෝජනය කරන මුදල
- ඔවුන්ගේ සුහද භාවය
- මොන වගේ බැංකු සමගද ගනුදෙනු කරන්නේ ( ඔබ ජීවත්වෙන ප්‍රදේශයට ආසන්න බැංකු සමග ද )

sinhalaebooks.com



- ඔවුන්ගේ ශාඛා දිවයින කුමන ප්‍රදේශවලද පිහිටා තියෙන්නෙ ( ඔබ ජීවත්වන ප්‍රදේශයට ආසන්නව ඔවුන්ගේ ශාඛාවක් පිහිටා තියනවද ? )
- ඔවුන් කොටස් වෙළඳපළ සම්බන්ධ ව කොතරම් සැලකිලිමත්ද
- අන්තර්ජාල පහසුකම් සලසනවා ද යන කාරණා ගැනයි.

සැයු :- සමහර තරුව්කාර ආයතන මහා පරිමාණ ආයෝජකයන් පිළිබඳ පමණක් වැඩි අවධානයක් ලබා දෙනවා ඒ වගේම සමහර තරුව්කාර ආයතන අවම ආයෝජන මුදලක් බලාපොරොත්තු වෙනවා

උදා :- රු 50000.00 හෙ සිට වගේ. සමහර ආයතන සඳහා අවම මුදලක් නෑ අපට රුපියල් 1000.00 සිට උවද ආරම්භ කරන්නට පුළුවන්.

sinhalaebooks.com



මේ සම්බන්ධව ඔබ බිය විය යුතු නෑ. හැමෝම නවතින්නේ මෙන්න මෙතනදී. ඔබට මෙම ආයතන පිළිබඳ තොරතුරු ඉතා පහසුවෙන් කොටස් වෙළෙඳපොළ නිල වෙබ් අඩවිය වන WWW.CSE.LK වෙබ් අඩවියෙන් ලබා ගන්න පුළුවන්. ඔවුන්ගේ දුරකථන අංක නිල වෙබ් අඩවි සහ සියලුම තොරතුරු

" තැරැව්කාර ආයතන පිළිබඳ තොරතුරු මෙම පොතේ අවසානය දක්වා ඇත "

දැන් ඔබට කරන්න තියෙන්නේ ඔබ තෝරාගත් තැරැව්කාර ආයතනයට හො කිපයකට දුරකථන ඇමතුමක් දීම මගින් හෝ ඔබගේ ප්‍රදේශයට ළඟ ශාඛාවක් තිබේනම් එම ශාඛාවට ගොස් ඔවුන්ගේ තොරතුරු විමසීමයි.

sinhalaebooks.com



අනිවාර්යෙන්ම ඔවුන්ගෙන් සුහද සේවාවක් බලාපොරොත්තු වන්න පුළුවන්. මෙම තරැව්කාර ආයතනයකට යන විට ඔබගේ අතේ මුදල් තිබීම අත්‍යවශ්‍ය කාරණයක් නොවේ. ඔබට ඔවුන්ගෙන් තොරතුරු විමසා කිසිම ගැටළුවක් නොමැතිව නැවත පැමිණෙන්න පුළුවන්.

මේ සියලු කටයුතු නොමිලයේ සිදු කරන බව මතක තබා ගන්න තරැව්කාර ආයතනයේ ගාස්තු වශයෙන් අය කරන්නේ ඔබ කොටස් මිලදී ගැනීමේදී හෝ විකිණීමේ දි අයකරන 1.12 % ක **( රුපියල් මිලියන 100 දක්වා )** මුදල පමණි.

ඔබ එසේ තරැව්කාර ආයතනයක් තෝරාගත් පසු ඔබට කරන්න තියෙන්නේ C.D.S

sinhalaebooks.com



ගිණුමක් ආරම්භ කිරීම පමණයි. අප 5 වන පරිච්ඡේදයෙන් මේ ගැන සාකච්ඡා කළා

එහි සඳහන් ආකාරයට තැරැව්කාර ආයතනයෙන් C.D.S ගිණුම සඳහා වූ අයදුම්පත රැගෙන එහි නිවැරදි තොරතුරු ඇතුලත් කර

**" තොරතුරු ඇතුලත් කිරීමට අපහසුනම් තැරැව්කාර ආයතනයේ සහයෝගය ලබා ගන්න පුළුවන් "**

ඊට අවශ්‍ය ලියකියවිලි සමග තැරැව්කාර ආයතනයට බාර දීම පමණයි. ඉන්පසු ඔබට දිනක් වැනි කෙටි කාලයක් තුළ කොටස් මිලදී ගැනීමේ හැකියාව ලැබෙනවා සහ ඔබට තැරැව්කාර ආයතනය මගින් ඔබ වෙනුවෙන ආයෝජන උපදේශකයෙක් වෙන් කරනවා

sinhalaebooks.com



**ඔබ කොටස් වෙළෙඳපොළ ආයෝජනයට යනවිට ඔහුගෙන් කොටස් වෙළඳපොළ සහ සමාගම් ගැන බොහෝ විස්තර දැනගන්න පුළුවන්**

**" හැකි සෑම විටම ඔහු ගෙන් ප්‍රයෝජන ලබාගන්න "**

ඔබ වෙනුවෙන් කොටස් මිල දි ගැනීම සහා විකිණීම සිදුවන්නේ මෙම ආයෝජන උපදේශකයා විසිනි.


මේ සියල්ල අන්තර්ජාලය මගින් කර සිදුකරගත හැකිය නමුත් ආධුනිකයකුට තරැව්කාර ආයතනයක සහයෝගය ලබාගැනීම වැදගත් කාරණයකි.

sinhalaebooks.com



# 7

# කොටස් වෙළඳපොළ ආයෝජනය කරන ක්‍රම




කොටස් වෙළෙඳපොළ තුළ මුදල් ආයෝජනය කර ලාභ ලැබීමේ ක්‍රම විශාල ප්‍රමාණයක් ඇත. ඒකෙන් ප්‍රධාන ක්‍රම 3ක් තියනවා

sinhalaebooks.com



I. **Day trading**
II. **Swing trading**
III. **Investing**

## Day trading

මෙම ක්‍රමයේදී සිදුවන්නේ ඔබ දිනක් ඇතුලත කොටස් මිලදී ගැනීම සහ යම් ලාභයක් තබාගෙන එදිනම විකිණීමයි. මෙහිදී තරව්කාර ගාස්තු අය කරන්නේ මිලදී ගැනීමේදී 1.12% ක් පමණි. දිනක් තුළ කොටස් විකිණීමේදී කිසිම මුදලක් අය වන්නේ නැත. මෙහිදී අවදානම වැඩි බව මතක තබාගන්න.

sinhalaebooks.com



# Swing trading

මෙම ක්‍රමයේදී සිදුවන්නේ කොටස් මිලදී ගෙන සතියක් හෝ මාසයක් වැනි කාලයක් ඔබ සතුව එම කොටස් තබා ගෙන. ඔබ බලාපොරොත්තු වන ලාභ ප්‍රතිශතයට පැමිණි පසු එම කොටස් විකිණීමයි. මෙහිදී තරමක් දුරට අවදානම අඩුයි.

# Investing

මෙම ක්‍රමය ලොව සාර්ථක මිනිසුන් ගේ අවධානය දිනා ගත් ක්‍රමයකි.මෙහිදී සිදුවන්නේ මිලදී ගන්නා කොටස් දීර්ඝකාලීනව ළඟ තබා ගැනීමයි.

sinhalaebooks.com



උදා :- අවුරුදු 1ක් හො අවුරුදු 3 නැත්තම් ඉටත් වඩා වැනි කාලයක් ඔබ සතුව කොටස් තබාගැනීම

මෙහිදී අපට ලාභාංශ වගේම දීර්ඝ කාලීනව කොටස් ළඟ තබා ගැනීමේදී කොටස් මිල ඉහල ගිය විට නැවත එම කොටස් විකුණා එම ලාභය ද ලබා ගැනීමට හැකියාව තිබෙනවා.

sinhalaebooks.com



# 8.

## කොටස් මිලදී ගැනීමේ ක්‍රම

**මෙය අපට ක්‍රම දෙකකට සිදු කළ හැක**

1. ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ
2. ද්විතීයික කොටස් වෙළෙඳපොළ

## ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ

ප්‍රාථමික කොටස් වෙළෙඳ පොළේ දී සිදුවන්නේ අදාල මිල කළ සමාගම මගින් ම කොටස් මිලදී ගැනීමයි.

සමාගමක් විසින් මුලින්ම කොටස් නිකුතුවක් සිදු කරන්නේ ප්‍රාථමික වෙළෙඳපොළ හරහා ය.

sinhalaebooks.com



සමාගමක් නිකුත් කළ කොටස් සෘජුව මිලදී ගැනීම ප්‍රාථමික වෙළෙඳපොළ ලෙස හඳුන්වයි.

සමාගමක් මෙසේ කොටස් නිකුතුවක් සිදු කිරීමේදී විශාල ප්‍රචාරයක් ලබා දෙයි. පුවත්පත් ජනමාධ්‍ය හරහා කොටස් නිකුතුව පිළිබඳ විස්තර ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඊට අමතරව සමාගම් විසින් කොටස් නිකුතුවට අදාළ විස්තර ඇතුළත් පොතක් නිකුත් කරයි. එය **සංස්ථා ප්‍රකාශය** ලෙස හඳුන්වයි. මේ සංස්ථා ප්‍රකාශය තුළ සමාගම සහ කොටස් පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් කර ඇත. මෙය සමාගම සඳහන් කරන ඕනෑම ස්ථානයකින් ලබා ගැනීමට හැකියාව ඇත.

sinhalaebooks.com



## ද්විතික කොටස් වෙළෙඳපොළ

ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ තුළින් මිලදී ගත් කොටස් නැවත විකිණීම හා මිලදී ගැනීම සිදුවන්නේ ද්වීතික වෙළඳපොළ මඟිනි.

ප්‍රාථමික වෙළෙඳපොළ මගින් කොටස් මිලදී ගැනීම පමණක් සිදු කළ හැකි අතර ද්වීතික වෙළඳපොළ මගින් කොටස් මිලදී ගැනීම හා විකිණීම කළ හැකිය.

උදා :- X සමාගමේ සංවර්ධන කටයුත්තක් සඳහා කොටස් වෙළඳපොළට කොටස් නිකුතුවක් කරනවා. ඉතින් මුලින්ම ඔබට මෙම කොටස් මිලදී ගැනීමට සිදුවන්නේ ප්‍රාථමික වෙළෙඳපොළ හරහායි.

sinhalaebooks.com



## " අදාල සමාගම තුළින්ම මිලදී ගැනීම "

මිලදී ගත් කොටස් අවුරුද්දකින් ඔබ විකිණීමට තීරණය කරනවා. එම කොටස් වෙනත් ආයෝජකයකු විසින් මිලදී ගැනීම සහ ඔබ විසින් විකිණීම ද්වීතික වෙළඳපොළයි.

sinhalaebooks.com



## කොටස් වර්ග

- සාමාන්‍ය කොටස් ( ඡන්ද බලය සහිත / ඡන්ද බලය රහිත )
- වරණීය කොටස්
- කොටස් බලපත්‍ර
- සමාගමික ණයකර
- රජයේ භාණ්ඩාගාර බිල්පත්
- රජයේ භාණ්ඩාගාර බැඳුම්කර

" මෙය සාමාන්‍ය කොටස් හා වරණීය කොටස් ලෙස ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි "

sinhalaebooks.com



## සාමාන්‍ය කොටස්

ශ්‍රී ලංකාව තුළ ආයෝජකයන් අතර වැඩි ජනප්‍රියතාවක් තිබෙන්නේ මෙම සාමාන්‍ය කොටස් සඳහාය.

**" සමාගමක සැබෑ හිමිකාරිත්වය ලබා දෙන කොටත් සාමාන්‍ය කොටස් වේ "**

සාමාන්‍ය කොටස් හිමියකුට සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වීමට අවස්ථාව හිමි වන අතර නිශ්චිත ලාභාංශ ප්‍රතිශතයක් හිමි නොවේ..

sinhalaebooks.com



**මෙම සාමාන්‍ය කොටස් වර්ග දෙකකට බෙදේ**

1. **ඡන්ද බලය සහිත කොටස්**
2. **ඡන්ද බලය රහිත කොටස්**

මෙම කොටස් වර්ග දෙකේ ප්‍රධාන වෙනස වන්නේ වාර්ෂික මහා සභා රැස්වීමේදී ඡන්දය ප්‍රකාශ කිරීමේ හැකියාව සහ නොහැකියාව පමණයි.

sinhalaebooks.com



# <u>වරණීය කොටස්</u>




ශ්‍රී ලංකාව තුල එතරම් ප්‍රසිද්ධියක් නොසුලන සහ ආයෝජකයන් එතරම් ඇල්මක් නොදක්වන නිසා මෙම කොටස් මිල එතරම් ඉහළ පහළ යාමක් සිදුවන්නේ නැත.

**" සමාගමේ හිමිකාරීත්වය හිමි නොවුනත් නිශ්චිත ලාභාංශ ප්‍රතිශතයක් ලබා දෙන කොටස් වර්ණය කොටස් වේ. "**

sinhalaebooks.com



# 9.

## කොටස් මිල දර්ශක

කොටස් වෙළඳපොළේ සිදුවන කොටස් වෙනස් වීම් මැනීම සඳහා යොදා ගන්නා දර්ශක කොටස් මිල දර්ශක ලෙස හඳුන්වයි. එය සමස්ත මිල දර්ශකය සහ

S&P SL20 මිල දර්ශක ලෙස ප්‍රධාන කොටස් දෙකකි.

### සමස්ත මිල දර්ශකය

මෙම මිල දර්ශකයේ කොටස් වෙළෙඳපොළේ ඇති සියලුම කොටස් නියෝජනය වේ.

sinhalaebooks.com



## S&P SL20 දර්ශකය

මෙම මිල දර්ශකය මගින් කොටස් වෙළෙඳ පොළේ වඩාත්ම ද්‍රවශීලී සහ විශාල ම සමාගම් 20 නියෝජනය කරයි.

sinhalaebooks.com



# 10.

## කොටස් මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

- මුලින්ම මතක තබාගන්න කොටස් මිල සෑම විටම ඉහළ යනවා කියලා හිතන්න එපා. මෙය ඉහළ යාම සහ පහළ යාම සිදුවිය හැකිය.
  කොටස් මිලදී ගැනීමේදී මේ ගැන සැලකිලිමත් විය යුතුය.

- ඔබගේ කොටස් තරුව්කාර ආයතනය විසින් ඔබ වෙනුවෙන් ආයෝජන උපදේශකයෙක් වෙන් කරන අතර ඔහුගෙන් හැකි සෑම විටම උදවු ලබාගන්න.

sinhalaebooks.com



**" නමුත් ආයෝජනයකදි ඔබට යම් අලාභයක් සිදු වුවහොත් එහි සම්පූර්ණ වගකීම ඔබ විසින් දැරිය යුතුය "**

- කොටස් මිලදී ගන්න සමාගම සම්බන්ධව පූර්ණ අවබෝධය ලබාගන්න. සමාගම සම්බන්ධ හැකි තරම් දත්ත තොරතුරු එකතු කරගන්න.

**තොරතුරු රැස් කරගත ක්‍රම කීපයක්**

- **WWW.CSE.LK ( කොළඹ කොටස් වෙළඳපොළ  නිල වෙබ් අඩවිය මගින් )**
- **සමාගමේ නිල වෙබ් අඩවිය**
- **මිල දර්ශක**
- **ආයෝජන උපදේශක**
- **GOOGLE**
- **සංස්ථා ප්‍රකාෂය**

sinhalaebooks.com



මෙසේ සදහන් කළ හැක.

- තම ආයෝජන උපදේශක ලබා දෙන නිර්දේශ මත පමණක් කොටස් මිලදී ගැනීම සිදු කරන්න එපා

- ක්ෂේත්‍ර කීපයක් මත මුදල් ආයොජනය කරන උදා :- HOTEL / BANCK වැනි විවිධ ශ්‍රේෂ්ය මත මුදල් ආයෝජනය කරන්න
- සමාගම සම්බන්ධ සමාජ මතවාද ගැන සැලකිලිමත් වන්න

- සමාගම විසින් ලාභාංශ ලබා දෙනවාද එය කෙසේද සිදුවන්නේ යන කාරණා පිළිබඳ සැලකිලිමත් වන්න.

sinhalaebooks.com



- සුළු මුදලකින් ආයෝජනය ආරම්භ කර ඉගෙනගනිමින් ඉදිරියට යන්න.

- කොටස් වෙළඳපොළ ආයෝජනයට පසු සෑම විටම ඒ පිළිබඳ අවධානයෙන් සිටින්න.

- කටකථා ආරංචි මත කොටස් මිලදී ගැනීම සහ විකිණීම සිදු නොකරන්න.

sinhalaebooks.com



# 11.

# කොටස් තැරැව්කාර ආයතන

**බාට්ලීට් රෙලිගෙයා සෙකියුරිටීස් පුද්ගලික සමාගම**

"බාට්ලීට් නිවස", 65, බේබෑක් පෙදෙස, කොළඹ 2.

+94 11 5 220 200

info@bartleetstock.com

http://www.bartleetreligare.com

Mr. Sujeewa Peiris

අධ්‍යක්ෂක/ ප්‍රධාන විධායක නිලධාරි

**ඇක්විටි තැරුව්කාර පුද්ගලික සමාගම**

53, ධර්මපාල මාවත,

කොළඹ 3.

+94 11 2 206 206

sales@acuitystockbrokers.com

sinhalaebooks.com



http://www.acuity.lk

ප්‍රශාන් ප්‍රනාන්දු මහතා

අධ්‍යක්ෂක/ ප්‍රධාන විධායක නිලධාරි

**ජෝන් කීල්ස් තැරුව්කාර පුද්ගලික සමාගම**

186, චොක්ෂෝල් වීදිය,

කොළඹ 2.

+94 11 2 306 250

jkstock@keells.com

http://www.jksb.com

තිවංක රත්නායක මහතා

ප්‍රධාන විධායක නිලධාරි

**ආශා සෙකියුරිටීස් පුද්ගලික සමාගම**.

නො.60, 5 වැනි පටුමග,

sinhalaebooks.com



කොළඹ 03.

+94 11 2 429 100

asl@ashasecurities.net

http://www.ashasecurities.net

දිමුතු අබේසේකර මහතා

අධ්‍යක්ෂක/ ප්‍රධාන විධායක නිලධාරි

**ඇසෙට්ලයින් සෙකියුරිටීස් පුද්ගලික සමාගම.**

120, 120A, පන්නිපිටිය පාර,

බත්තරමුල්ල.

+94 11 4 700 100

info@assetline.lk

http://assetline.lk/product/stock-broking

කිෂාන් වයිරවනාදන් මහතා

කළමණාකාර අධ්‍යක්ෂක /ප්‍රධාන විධායක නිලධාරි

sinhalaebooks.com



## සමර්විල් තැරුව්කාර පුද්ගලික සමාගම

1A, පාර්ක් වේ, උද්‍යාන පාර, කොළඹ 5.

+94 11 2 502 852 / +94 11 2 502 854 / +94 11 2 502 858 / +94 11 2 502 862

contact@somerville.lk

ශලිනි ඩයස් මිය

අධ්‍යක්ෂක/ ප්‍රධාන විධායක නිලධාරි

## ජේ බී සෙකියුරිටීස් පුද්ගලික සමාගම

150, ශාන්ත ජෝසප් මාවත,

කොළඹ 14.

+94 11 2 490 900

jbs@jb.lk

https://www.jbs.lk

මූර්තාසා ජෙෆර්ජී මහතා

ප්‍රධාන විධායක නිලධාරි

sinhalaebooks.com



## ලංකා සෙකියුරිටීස් පුද්ගලික සමාගම

228/1, ගාලු පාර,

කොළඹ 04

+94 11 4 706 757 / +94 11 2 554 942

info@lankasec.com

http://www.lankasecurities.com

කෝසල ගමගේ මහතා

කළමණාකාර අධ්‍යක්ෂක /ප්‍රධාන විධායක නිලධාරි

## ඒෂියා සෙකියුරිටීස් පුද්ගලික සමාගම

4 වන මහල, ලී හෙඩ්ජස් කුළුණ, නො. 349, ගාලු පාර

කොළඹ 3.

+94 11 7 722 000

inquiries@asiasecurities.lk

http://asiasecurities.net

යූ එල් බී ආරියරත්න මහතා

ප්‍රධාන විධායක නිලධාරි

sinhalaebooks.com



## කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් පුද්ගලික සමාගම

42, මොහොමඩ් මාකන් මාකර් මාවත,

කොළඹ 3.

+94 11 2 174 174 / +94 11 2 174 175

inquiries@capitaltrust.lk

http://www.capitaltrust.lk

තුෂාන් වික්‍රමසිංහ මහතා

කළමණාකාර අධ්‍යක්ෂක

## එස් සී සෙකියුරිටීස් පුද්ගලික සමාගම

5 වන මහල, 26 බී, අල්විස් පෙදෙස,

කොළඹ 03.

+94 11 4 711 000 / +94 11 4 711 001

itdivision@sampathsecurities.lk

http://www.sampathsecurities.lk

රොෂාන්ත ප්‍රනාන්දු මහතා

ප්‍රධාන විධායක නිලධාරි

sinhalaebooks.com



## සී ටී සී එල් එස් ඒ සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

4-14, මැජෙස්ටික් සිටි, 10, දුම්රිය පොළ පාර,කොළඹ 4.

+94 11 2 552 290 - 4

info@ctclsa.lk

http://www.ctclsa.lk

කනිෂ්ක හේවගේ මහතා

ප්‍රධාන විධායක නිලධාරි

## ෆස්ට් කැපිටල් ඉක්විටිස් පුද්ගලික සමාගම

නො 2, ඩීල් පෙදෙස,කොළඹ 03.

+94 11 2 639 898

equity@firstcapital.lk

http://www.firstcapital.lk

ජාලිය විජේරත්න මහතා

ප්‍රධාන විධායක නිලධාරි

sinhalaebooks.com



## එන් ඩී බී සෙකියුරිටීස් පුද්ගලික සමාගම

2 වන මහල, NDB කැපිටල් බිල්ඩින්, නො.135, බෞද්ධාලෝක මාවත, කොළඹ 4.

+94 11 2 131 000

mail@ndbs.lk

http://www.ndbs.lk

ගිහාන් කුරේ මහතා

ප්‍රධාන විධායක නිලධාරි

## නේෂන් ලංකා ඉක්විටිස් පුද්ගලික සමාගම

නො.44, ගිල්ඩ්ෆර්ඩ් ක්‍රෙසන්ට්,

කොළඹ 07.

+94 11 488 9061-3/ +94 11 789 8302

+94 11 268 8899

info@nlequities.com

http://www.nlequities.com

රැල්ෆ් විජේසිංහ මහතා

ප්‍රධාන විධායක නිලධාරි